
# බෝංචි වැස්ස



කේ . කේ . කුෂිණි දෙව්මිණි කොඩිකාර

# බෝංචි වැස්ස


## කේ.කේ.කුෂාණි දෙව්මිණි
## කොඩිකාර

## 7 වන ශ්‍රේණිය B

### මහ/සිද්ධාර්ථ මහා විද්‍යාලය


### ( කතෘගේ පළමු එළිදැක්වීමයි )


කෘතිය එලකරන දිනය 2025.02.08

ISBN අංකය : 978-624-208-703-0

# පිදුම

දෙඇස් පහදා මෙලොව

බුද්ධියෙන් හා මනුෂ්‍යත්වයෙන් පිරිපුන් දියණිය

බිහිකිරීමට වෙර දරණ දයාබර දෙමාපියන්ටත්,

ගුරු මෑණිවරුන්ටත් , ගුරු පියවරුන්ටත් මේ පොත

සෑදීමට මා මෙහෙයවූ සැමට සඳබැඳි ගෞරවයෙන් යුතුව

මෙම පොත පිළිගන්වමි.

# පෙරවදන


සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණිය යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම ඊට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනඟා ඒ රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්තදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩ නගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනය සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර<br>
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර

එකෝමත් එක රටක පුංචි ලස්සන ගමක් තිබුණා.



ඒ ගමේ නම තමයි කැටවල. ඒ ගමේ පුංචි ගොවි ගෙවල් කිහිපයක් තිබුණා. අනෙක් ගෙවල් වලට වඩා ඈතින් කැලෑවට යාබදව පුංචි ලස්සන ගොවි ගෙදරක් තිබුණා. ඒ ගෙදර හිටියේ ගෙවිලියයි, ගොවි මහත්තයයි, දුවයි පුතයි.



දුවගේ නම "කවිනි" පුතාගේ නම "සුමුදු" අක්කයි මල්ලි දෙන්නයි අම්මටයි තාත්තාටයි ගොඩක් ආදරෙයි.

ඒ දෙන්නා අම්මටයි තාත්තාටයි උදේ වැඳලා පාසල් යන්න පිටත් වුණා. පාසලේදී යාලුවෝ ගුරුවරුන් පාඩම් කියා දෙන විට හොඳින් සවන් දී පාඩම් වැඩ කළා. කවිනි හා සුමුදු පාඩම් වැඩ වලට පමණක් නොව ක්‍රීඩා වැඩ වලටත් ගොඩක් දක්ෂයි. ඒ වගේම සුමුදු මල්ලිත් දහයෙන් පහළ දුවන තරගයේ පළවෙනියා වුණා. මේ දෙන්නාට දුවන තරග වලින් ජය ගන්න හැකි වුණේ අම්මා සමග දර හොයන්න කැලෑවට ගියාම තාත්තා හා අම්මා දර හොයනකම් මේ දෙන්නා තරගෙට දුවන එක තමයි කලේ. ඒ හුරුව නිසා කවිනිට හා සුමුදුට ඒ තරගවලින් ජය ගන්න රුකුලක් ලැබුණා.

ඒ දෙන්නා පාසැල් ගොස් ගෙදර පැමිණියාම පාසලෙන් දුන් වැඩ අවසන් කර අම්මාගේ තාත්තාගේ වැඩවලට උදව් කරන්න හේනට යනවා.

කවිනිගේ හා සුමුදුගේ විනෝදාංශය වූයේ පැළ හිටවන එකයි.

දෙන්නා පාත්ති දෙකක් සකස් කර බීජ සිටුවා දවසින් දවස වතුර දමනවා. සතියකට පසු මිරිස් බීජ පැලවී තිබුණා. බෝංචි බීජත් පැළවී තිබුණා. දවස් දෙකින් දෙකට ජලය දැමුවා. මිරිස් ගස්වල මල් පිපී කරල් හටගත්තා. බෝංචි වැල්වලත් මල් පිපී බෝංචි කරල් සෑදී දිනෙන් දින ලොකු වුණා. සුමුදුට හා කවිනිට වගේම අම්මටයි තාත්තටයි දෙන්නටත් ගොඩක් සතුටුයි. තාත්තා කීවා " පුතේ ඔයාලා දෙන්න පුංචි වුණාට ලොකු දෙයක් කළේ. වෙන ළමයි රූප පෙට්ටිය දිහා බලන් ඉන්නකොට මගේ දරුවො දෙන්නා මගේ ජීවිතේ බරෙන් ටිකක් අඩු කළා" කීවා. අම්මා, තාත්තා අතින් කිව්වා " මේ මිරිසුයි බෝංචියි විකුණලා ගන්න සල්ලි වලින් දරුවන්ගේ අලුත් පන්තියට ඕනේ පොත්,පැන්සල් සහ ඉස්කෝලෙට ඕන කරන බඩු ටික ගන්න තියාගමු කියලා". අම්මයි තාත්තයි දරුවන් දෙදෙනයි අස්වැන්න කඩාගෙන ගොවි ගෙදරට අරන් ගියා.

ගොවි ගෙදරට ආසන්නයේ තියෙන කැලෑ රොදේ පුංචි ඌරු මී පවුලක් සිටියා. ඒ පවුලේ සිටියේ අම්මයි තාත්තයි මී පුතයි විතරයි.

මී අම්මා කීවා " පුතේ අපි කෑම සොයාගෙන එනකන් මේ ගෙදරට වෙලා ඉන්න කියා".



මී අම්මා හා තාත්තා කෑම හොයාගෙන කැලෙන් එළියට පැමිණියා. එන විට ගොවි ගෙදර ළඟට පැමිණියා. මී අම්මා කීවා " මට හොඳ කෑම සුවඳක් එනවා අපි මේ ගහ දිගේ උඩට ගිහින් වහලයට පැනලා බිත්තිය දිගේ යමු" කියා.

අම්මා කීව විදිහටම ගේ ඇතුලට මියන් දෙදෙනාම ගමන් කළා."

අපි තුන්දෙනාට ඕනවටත් වැඩිය මෙතන කෑම තියෙනවනේ නෝනේ" කියා මී තාත්තා කිව්වා.

මී අම්මා කිව්වා "අපි දෙන්නා කෑම කාලා පුතාටත් ඇරන් ඉක්මනින්ම මෙතනින් යමු කියලා කිව්වා".තාත්තයි අම්මයි දෙන්නම ඉක්මනින්ම කෑම කෑවා.

තාත්තා අම්මා අතින් කිව්වා "මේ කරල් වල ඇටයි පොත්තයි හරිම කිරි රහයි. අපේ පුතාට මේවාගෙන් අරන් යමු කීවා". අම්මයි තාත්තයි බෝංචි කරල් අරන් මී ගෙදරට යන්න පිටත් වූවා.

"මී පුතාට බෝංචි කරල් ගිහින් දුන්නා. මී පුතා බඩ පිරෙන්න කෑවා. අම්මා ඉතුරු කරල් ටිකේ පොත්තෙන් ඇට අයින් කරලා වට්ටියකට දැම්මා ඒ පොතු ටික රෑ අම්මයි තාත්තයි කෑමට ගත්තා.

රැයක් ගෙවී උදෑසන පැමිණියා.

සුපුරුදු පරිදි අවදි වී මී අම්මයි මී තාත්තයි කෑම හොයාගන්නපිටත් වෙන්න ගෙදර දොර ළඟට පැමිණියා.

අම්මා පුතාට කීවා

"පුතේ ඔයා කොහෙටවත් යන්න එපා මේ වට්ටියේ තියෙන බෝංචි ඔයාට බඩගිනි වන විට කන්න යැයි කීවා." හොඳයි අම්මේ කියා පුතා කීවා".

අම්මයි තාත්තයි ගමනට පිටත් වුවා. පුතා අම්මා හා තාත්තා ගෙදරින් පිට වෙනකම් බලා සිට හිමින් සීරුවේ ගෙදරින් එළියට ආවා.

මේ ගුල ඇතුලේ අඳුර විතරයි. එළියේ ලස්සන පාට පාට දේවල් තියෙනවා හරි එළියයි." එළියට එන විට මගේ ඇස් දෙකට හරි අමාරුවක් දැනුනා". ඒත් මේ දේවල් බලන්න ඇයි අම්මා මාව එක්කන් ආවෙ නැත්තේ, මම ආසයි මෙහෙට වෙලා ඉන්න.

මී පැටියා බෝංචි ඇට වට්ටිය රැගෙන එන්න මී ගුල ඇතුලට ගියා. මේ පැටියා බෝංචි වට්ටිය රැගෙන ගුලෙන් පිටතට පැමිණියා. එළියේ ඉඳගෙන බෝංචි ඇට කෑවා. එක පාරටම අඳුර ආවා. කුරුල්ලන් හයියෙන් කෑ ගැහුවා පොඩි කලබලයක් වගේ කියා මී පැටියාට සිතුනා. ටික වෙලාවකට පසුව මහා හයියෙන් ගොරවන්න ගත්තා.

අකුණු ගැහුවා, ලොකු වතුර බින්දු උඩින් වැටෙන්න ගත්තා. මී පැටියා හොඳටම බය වුණා. ඉක්මනින්ම ගුල ඇතුලට යන්න වට්ටිය ගත්තා.

මී පැටියා ගුල තුළට පැමිණියා. බෝංචි ඇටත් එළියට හැලුණා. හවස් වන විට වැස්ස පැවුවා. අම්මයි තාත්තයි කෑම අරන් ආවා.

ඒ වැහැපු වැස්ස නැවත ආරම්භ වූවා. සැරින් සැරේට වැස්ස වහිනවා, පායනවා. කාලයක් ගත වුණා. මී අම්මා තාත්තා කෑම හොයන්න යන්න ගියා. මී පැටියා ගුලෙන් එළියට පැමිණියා. බෝංචි ඇට කන ගමන් පරිසරය ලස්සන බලපු සොඳුරු දසුන් මී පැටියාගේ මතකයට පැමිණියා. මී පැටියා ඒ තැනට ගියා.

මී පැටියා බෝංචි ඇට කාපු තැන දැන් ගොඩක් වෙනස් වෙලා ලොකු වැල් ගිහින් ලොකු බෝංචි කරල් ඇවිත්. සමහරක් කරල් කොළපාටයි. සමහරක් කරල් දුඹුරු පාටයි. අව්වත් ගොඩක් සැරට පායලා තිබුණා. ටික වෙලාවකට පසුව ටොක් ටොක් ගහලා තැනින් තැන ශබ්දයක් ඇසුණා.

බෝංචි ඇට උඩින් ඇවිත් තැනින් තැන බිමට වැටුණා. ලොකු හුළඟක් එකපාරටම ආවා. ඒ හුළඟට ගස් ඒමේ අත කැරකුනා. මී පැටියත් බය වුණා. මී පැටියා එතන ගලක් යටට රිංග ගත්තා.



එකපාරටම බෝංචි කරල් ඒ අතට මේ අතට හුලගෙ පාවී ගෙන ඇවිත් වැටුණා. හුළඟ අඩුවෙනවාත් මී පැටියා බලන් හිටියා. හිමිට ගුලට ගොස් වට්ටිය අරන් ඇවිත් බෝංචි ඇට හා කරල් එකතු කළා. මී පැටියාට වට්ටිය ගෙනියන්න බෑ බරයි. කටින් හා අතින් අල්ලගෙන බිම දිගේ ඇදගෙන ගියා. අම්මයි තාත්තයි කෑම අරන් පැමිණියා. මී පැටියා අම්මටයි තාත්තටයි බෝංචි වට්ටිය පෙන්නුවා. අම්මටයි තාත්තටයි ගොඩක් සතුටුයි. මේ බෝංචි පුතාට කොහෙන්ද කියා අම්මා ඇසුවා. බෝංචි වැස්සේ කතාව අම්මටයි තාත්තටයි මී පුතා කිව්වා.

මේ අතර තුරේ සුමුදු හා කවිනි බෝංචි විකුණා ගත් මුදලින් පන්තියට අවශ්‍ය බඩු ගත්තා. අම්මා තාත්තා එක්ක කැලෑවට දර හොයන්න ගියා. අම්මා තාත්තා දර හොයනකන් සෙල්ලම් කරන්න පටන් ගත්තා. මල්ලි කැලේ ඇතුලට දිව්වා. කවිනිත් මල්ලිගේ පසුපසම අල්ලන්න දිව්වා. අක්කා කිව්වා "මල්ලි මට හොඳටම මහන්සියි. මෙතන ටිකක් නවතිමු මේ ගල උඩ ඉඳන් ඉඳලා යං කිව්වා". මල්ලිත් සෙල්ලම් නතර කළා.

ටික වෙලාවකින් ලොකු හුළඟක් හැමුවා. සුමුදුට හා කවිනිට හරි සනීපයක් දැනුනා. හුළඟ ටිකෙන් ටික වැඩි වුණා. බෝංචි කරල්, ගස්වල කොල හුළඟට ඒ මේ අත බිමට වැටුණා."මල්ලි මෙන්න බෝංචි වැස්සක් වහිනවා" අක්කගේ ඇඟටත් මල්ලිගේ ඇඟටත් බොංචි කරල් වැටුණා.

මල්ලියි  අක්කා බෝංචි කරල් එකතු කරගෙන මල්ලිගේ සරමට දමාගෙන අම්මා හා තාත්තා සොයා ගමන් කළා.

අම්මට හා තාත්තට බෝංචි කරල් පෙන්වූවා. අම්මා ඇසුවා"කොහෙන්ද පුතේ මේ තරම් බෝංචි කරල් කියා".

අම්ම හා තාත්තා පුදුමයෙන් සහ සතුටෙන් බලන් හිටියා.

කවිනි හා සුමුදු බෝංචි වැස්සෙ කතන්දරය අම්මටයි තාත්තටයි කිව්වා. අම්මා හැමෝටම දෙයක් මතක් කළා."ඔයාලා හැමෝටම මතකද අපේ ගෙදර තිබුණු බොංචි අඩුවෙලා තිබුණා". ඒ අඩුවන බෝංචි වලට දෙයියෝ මගේ දරුවන් දෙන්නාට "බෝංචි වැස්සක්ම දීලා" කියා අම්මා විශ්ව මාතාවටයි දෙවියන්ටයි පින් දුන්නා. හැමෝම දරත් කඩන් බොංචිත් රැගෙන නිවස කරා සතුටින් පියමැන්නා.

# ස්තූතිය

“ බෝංචි වැස්ස ” කෘතිය රචනා කිරීමට මා දිරිගැන්වූ මගේ අම්මාටත්,තාත්තාටත් “ හෙරණගත්කරණි ” ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන මහාලේඛම් ගුරුතුමන් ඇතුලු කාර්යමණ්ඩලයේ සැම හටත් මහාමායාවේ විදුහල්පතිතුමියටත්, සිද්ධාර්ථ මහා විද්‍යාලයේ දයාරත්න හෙල්ලරාව විදුහල්පති තුමා හටත් ඊ.ඒ.ඕ.එල්.එම් ඇරැගොඩ නියෝජ්‍ය විදුහල්පතිතුමිය හටත් මගේ පංතිභාර ගුරුමෑණියන් හටත් මාගේ හෘදයාගම ස්තූතිය



**පසුවදන**

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනය ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් හැකියාවන් ඔපනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘති යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනය ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසය එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලය විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක් වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැක.මානව දැනුම ගබඩා කර තැබීමට තේ උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකවද මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගැලපෙමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින්එයට පිවිසී පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්

ISBN අංකය 978-624-208-703-0